එවං වුත්තෙ අසිබන්ධකපුත්තො ගාමණී භගවන්තං එතදවොච: අභික්කන්තං භන්තෙ -පෙ- උපාසකං මං භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 8. 1. 10

## මණිචූළකසුත්තං

424. එකං සමයං භගවා **රාජගහෙ** විහරති **වෙළුවනෙ කලන්දකනිවාපෙ**. තෙන ඛො පන සමයෙන රාජන්තෙපුරෙ රාජපරිසායං සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරා කථා උදපාදි: "කප්පති සමණානං සක්‍යපුත්තියානං ජාතරූපරජතං, සාදියන්ති සමණා සක්‍යපුත්තියා ජාතරූපරජතං. පතිගණ්හන්ති සමණා සක්‍යපුත්තියා ජාතරූපරජත"න්ති.

තෙන ඛො පන සමයෙන **මණිචූළකො ගාමණී** තස්සං පරිසායං නිසින්නො හොති. අථ ඛො මණිචූළකො ගාමණී තං පරිසං එතදවොච: මා අය්‍යා එවං අවචුත්ථ, න කප්පති සමණානං සක්‍යපුත්තියානං ජාතරූපරජතං, න සාදියන්ති සමණා සක්‍යපුත්තියා ජාතරූපරජතං, න පතිගණ්හන්ති සමණා සක්‍යපුත්තියා ජාතරූපරජතං, නික්ඛිත්තමණිසුවණ්ණා සමණා සක්‍යපුත්තියා අපෙතජාතරූපරජතාති. අසක්ඛි ඛො මණිචූළකො ගාමණී තං පරිසං සඤ්ඤාපෙතුං. අථ ඛො මණිචූළකො ගාමණී යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො මණිළචූකො ගාමණී භගවන්තං එතදවොච:

ඉධ භන්තෙ රාජන්තෙපුරෙ රාජපරිසායං සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරා කථා උදපාදි: කප්පති සමණානං සක්‍යපුත්තියානං ජාතරූපරජතං, සාදියන්ති සමණා සාක්‍යපුත්තියා ජාතරූපරජතං, පතිගණ්හන්ති සමණා සක්‍යපුත්තියා ජාතරූපරජතන්ති. එවං වුත්තාහං භන්තෙ තං පරිසං එතදවොච: මා අය්‍යා එවං අවචුත්ථ, න කප්පති සමණානං සක්‍යපුත්තියානං ජාතරූපරජතං, න සාදියන්ති සමණා සක්‍යපුත්තියා ජාතරූපරජතං, න පතිගණ්හන්ති සමණා සක්‍යපුත්තියා ජාතරූපරජතං, නික්ඛිත්තමණිසුවණ්ණා සමණා සක්‍යපුත්තියා අපෙතජාතරූපරජතාති. අසක්ඛිං ඛොහං තං භන්තෙ පරිසං සඤ්ඤාපෙතුං. කච්චාහං භන්තෙ එවං ව්‍යාකරමානො වුත්තවාදී චෙව භගවතො හොමි, න ච භගවන්තං අභූතෙන අබ්භාචික්ඛාමි, ධම්මස්ස චානුධම්මං ව්‍යාකරොමි, න ච කොචි සහ ධම්මිකො වාදනුපාතො ගාරය්හං ඨානං ආගච්ඡතීති.

මෙසේ වදාළ කල්හි අසිබන්ධකපුත්ත ගාමණී තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස, ඉතා මැනවි .. භාග්‍යවතුන් වහන්සේ අද පටන් දිවිහිමියෙන් සරණ ගිය උවසුවකු කොට මා දරන සේක්වා යි.

## 8. 1. 10

## මණිචූළක සූත්‍රය

424. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **රජගහනුවර සමීපයෙහි කලන්දකනිවාප** නම් **වෙළුවනාරාමයෙහි** වැඩවසන සේක. එසමයෙහි රජුගේ ඇතුළු පුර රජපිරිසෙහි එක්රැස් ව හිඳගත්තවුන් අතර මේ අතුරු කථාව පහළ විය; ශ්‍රමණ ශාක්‍යපුත්‍රයන්ට රන්රිදී කැප ය. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ රන්රිදී ඉවසත්. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ රන් රිදී පිළිගනිති යි.

එකල්හි **මණිචූළකගාමණී** තෙමේ ඒ පිරිසෙහි හුන්නේ වෙයි. ඉක්බිති මණිචූළක ගාමණී තෙමේ ඒ පිරිසට මෙය කී ය: ආයුෂ්මයෙනි, මෙසේ නො කියනු මැනව. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයන්ට රන්රිදී නො කැප ය. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ රන්රිදී නො ඉවසත්. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ රන්රිදී නො පිළිගනිත්. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ බහා තැබූ රන්රුවන් ඇතියහ. ඉවත් වූ රන්රිදී ඇතියහ යි. මණිචූළක ගාමණී තෙමේ ඒ පිරිස හඟවන්නට හැකි විය. එකල්හි මණිචූළක ගාමණී තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්නේ ය. එකත්පස් ව හුන් මණිචූළක ගාමණී තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය:

වහන්ස, මෙහි රජුගේ ඇතුළු පුර රජපිරිසෙහි එක්රැස්ව හිඳ ගත්තවුන් අතර මේ අතුරු කථාව පහළ විය: ශ්‍රමණ ශාක්‍යපුත්‍රයන්ට රන්රිදී කැපය, ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ රන්රිදී ඉවසත්, ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ රන්රිදී පිළිගනිති යි. වහන්ස, මෙසේ කී කල්හි මම ඒ පිරිසට මෙය කීමි: ආයුෂ්මයෙනි, මෙසේ නො කියනු මැනවි. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයන්ට රන්රිදී නො කැපය. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ රන්රිදී නො ඉවසත්. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ රන්රිදී නො පිළිගනිත්. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ බහා තැබූ රන් රුවන් ඇතියහ. ඉවත් වූ රන්රිදී ඇතියහ යි. වහන්ස, මම ඒ පිරිස හඟවන්නට හැකි වීමි. වහන්ස කිම, මම මෙසේ පවසන්නෙම් භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද්දක් කියන්නෙක් වෙම් ද? භාග්‍යවතුන් වහන්සේට බොරුවෙන් නො ද චෝදනා කෙරෙම් ද? ධම්මට අනුදමහක් පවසන්නෙම් ද? කරුණු සහිත කිසියම් වාදනුපාතයෙක් ගැරහිය යුතු තැනට නො ද පැමිණේ දූ යි.